# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 64 දරන
# පිරිවෙන් අධ්‍යාපන පනත

[සහතිකය සටහන් කළේ 1979 ඔක්තෝබර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ඔක්තෝබර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.10 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත

[සහතිකය සටහන් කළේ 1979 ඔක්තෝබර් මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 83/78.

**පිරිවෙන් අධ්‍යාපනය ප්‍රතිසංවිධානය කිරීම සඳහා ද පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද පිරිවෙන් ලියාපදිංචි කිරීම, නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම සඳහා සහ පිරිවෙන් අභ්‍යාස ආයතන පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. (1) මේ පනත 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනු වෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට මේ පනත ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු

2. (අ) භික්ෂූන් වහන්සේලාට ; සහ *පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු.*

(ආ) පිරිවෙනක පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කැමැත්තෙන් සිටින්නා වූ ද බෞද්ධ පරිසරයක ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නා වූ ද වයස අවුරුදු දහහතර ඉක්ම වූ ගිහි පිරිමි ශිෂ්‍යයන්ට

අධ්‍යාපන පහසුකම් සැලසීම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු වන්නේ ය.

3. (අ) පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම ; *පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ.*

(ආ) සැරියුත් මහ මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්නව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම ;

(ඇ) දේශීය සහ විදේශීය ධර්ම දූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරතවීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම සඳහා ශික්ෂණයක් දීම ; සහ

(ඈ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබාගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසාදීම

පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ වන්නේ ය.

## II වන කොටස

### පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය

පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය.

4. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය යනුවෙන් හැඳින්විය යුතු වූ ද පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු වූ ද මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය:—

(අ) සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ මහා නායක හිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරනු ලබන ඒ නිකායේ වෙනත් යම් භික්ෂූන් වහන්සේ නමක්;

(ආ) සියම් නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහා නායක හිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරනු ලබන ඒ නිකායේ වෙනත් යම් භික්ෂූන් වහන්සේ නමක්;

(ඇ) ශ්‍රී ලංකා අමරපුර නිකායේ මහා නායක හිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරනු ලබන ඒ නිකායේ වෙනත් යම් භික්ෂූන් වහන්සේ නමක්;

(ඈ) ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මහා නායක හිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරනු ලබන ඒ නිකායේ වෙනත් යම් භික්ෂූන් වහන්සේ නමක්;

(ඉ) අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඊ) පිරිවෙන් අධ්‍යාපනය භාර අධ්‍යක්ෂවරයා;

(උ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු, පිරිවෙන් අධ්‍යාපනයෙහි පළපුරුද්දක් ඇති භික්ෂූන් වහන්සේලා තුන් නමක්; සහ

(ඌ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු, බෞද්ධ අධ්‍යාපනයෙහි සහ බෞද්ධ කටයුතුවල සැලකිය යුතු පළපුරුද්දක් ඇති ගිහි බෞද්ධයන් තිදෙනෙක්.

(2) මණ්ඩලයේ සාමාජිකයන් විසින් සිය ප්‍රථම රැස්වීමේ දී එකී සාමාජිකයන් අතුරින් භික්ෂූන් වහන්සේ නමක් මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් තෝරා පත් කර ගත යුතු ය.

(3) පිරිවෙන් අධ්‍යාපනය භාර අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු ය.

(4) සභාපතිවරයා මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, මණ්ඩලයේ සාමාජිකයන් විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් භික්ෂූන් වහන්සේ නමක් ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

(5) යම් තැනැත්තෙක්—

(අ) බංකොලොත් නම් හෝ බුන්වත් තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබුවෙක් නම්; හෝ

(ආ) චරිත දූෂණය හා සම්බන්ධ යම් සාපරාධ වරදකට වරදකරු වී ඇත්නම් ; හෝ

(ඇ) තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු යයි නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් තීරණය කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නම් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(6) (1) වන උපවගන්තියේ (උ) ඡේදය හෝ (ඌ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ (මින් මතු "නම් කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සෑම සාමාජිකයකු විසින් (7) වන, (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, එසේ නම් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක් වූ කාල සීමාවක්, ධුරය දැරිය යුතු අතර නැවත නම් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය:

එසේ වුවද ඉල්ලා අස්වුන හෝ මිය ගිය හෝ අන් ලෙසකින් ධුරය හිස් කළ හෝ නම් කළ සාමාජිකයකු වෙනුවට නම් කරනු ලැබූ තැනැත්තකු කලින් ඉල්ලා අස් වුවහොත් හෝ මිය ගියහොත් හෝ අන් ලෙසකින් ධුරය හිස් කළහොත් මිස, තමා අනුප්‍රාප්තිකයා වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ඔහු විසින් ධුරය දැරිය යුතු ය.

(7) යම් නම් කළ සාමාජිකයකු විසින්, තමා ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා අමාත්‍යවරයා අමතා ලිපියක් යැවීමෙන්, තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) ඉවත් කිරීම පිළිබඳව කිසිම හේතුවක් නොදක්වා, අමාත්‍යවරයා විසින් යම් නම් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(9) යම් නම් කළ සාමාජිකයකු, සභාපතිවරයාගේ අවසරය නොමැතිව, මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණියහොත්, ඔහු ස්වකීය ධුරය හිස් කළ යුතු ය.

(10) රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ තම ධුරයේ කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ යම් සාමාජිකයකුට නොහැකි වන අවස්ථාවක—

(අ) ඒ සාමාජිකයා, (1) වන උපවගන්තියේ (අ) සිට (ඇ) තෙක් වූ ඡේදවල සඳහන් යම් නිකායක මහා නායක ස්වාමීන් වහන්සේ නම්, ඒ මහා නායක ස්වාමීන් වහන්සේ විසින් නම් කරන ලද භික්ෂූන් වහන්සේ නමක් විසින් හෝ මහා නායක ස්වාමීන් වහන්සේ විසින් එසේ නම් කරනු ලැබිය නොහැකි වන අවස්ථාවක, ඒ නිකාය විසින් තෝරාපත් කරනු ලැබූ භික්ෂූන් වහන්සේ නමක් විසින් හෝ ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කළ හැකි ය ;

(ආ) ඒ සාමාජිකයා, (1) වන උපවගන්තියේ (අ) සිට (ඈ) තෙක් වූ ඡේදවල සඳහන් යම් මහා නායක ස්වාමීන් වහන්සේ නමක් විසින් නම් කරන ලද භික්ෂූන් වහන් සේ නමක් නම්, ඒ මහා නායක ස්වාමීන් වහන්සේ විසින් නම් කරන ලද වෙනත් භික්ෂූන් වහන්සේ නමක් විසින් ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කළ හැකි ය;

(ඇ) ඒ සාමාජිකයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා නම් හෝ පිරිවෙන් අධ්‍යාපනය භාර අධ්‍යක්ෂවරයා නම්, අමාත්‍යවරයා විසින් නම් කරන ලද, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධරයකු විසින් ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කළ හැකි ය; තව ද

(ඈ) ඒ සාමාජිකයා, නම් කළ සාමාජිකයකු නම්, අමාත්‍යවරයා විසින් නම් කරන ලද වෙනත් සුදුසු තැනැත්තකු විසින් ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කළ හැකි ය.

(11) මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් යම් පාරිශ්‍රමිකයක් ලැබීමට මණ්ඩලයේ සාමාජිකයන්ට හිමිකම් නොලැබෙන්නේ ය:

එසේ වුව ද, ඒ සාමාජිකයන්ට දීමනාවක් ගෙවීම යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, ඔහු විසින් ඒ සාමාජිකයන්ට එසේ දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

(12) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය, මණ්ඩලයේ සාමාජිකයන් හය දෙනකුගෙන් සංයුක්ත වන්නේ ය:

එසේ වුවද, මණ්ඩලයේ අනුගාමී රැස්වීම් දෙකක දී ගණපූරණය නොවූ අවස්ථාවක, සභාපතිවරයා විසින් හදිසි යයි සහ අවශ්‍ය යයි සලකනු ලබන මණ්ඩලයේ යම් කර්තව්‍යයක්, මණ්ඩලයේ අනුමතය නොමැතිව, සභාපතිවරයා විසින් ඉටු කරනු ලැබීම නීත්‍යනුකූල වන අතර ඒ කර්තව්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව ඉටු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(13) යටත් පිරිසෙයින් සෑම මාස තුනකට ම වරක්වත් මණ්ඩලය රැස්විය යුතු ය.

(14) මණ්ඩලයේ සාමාජිකයන් හතර දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් ලිඛිත ඉල්ලීමක් කරන ලද විට, සභාපතිවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

(15) මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබුණ ද, මණ්ඩලය විසින් කටයුතු කරනු ලැබිය හැකි අතර, එසේ සාමාජික ධුරයක පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා පමණක්, මණ්ඩලයේ කිසිම තීරණයක් අවලංගු නොවිය යුතු ය.

(16) මණ්ඩලයේ කටයුතු කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය, මේ පනත යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය යුතු ය.

5. (1) මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගවලට යටත්ව, මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය:— මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

(අ) පිරිවෙන් අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ආ) පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳව කරුණු හැදෑරීමට සහ ඒ පිළිබඳව පර්යේෂණ පැවැත්වීමට අනුග්‍රහ දැක්වීම;

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලය වෙත යොමු කරනු ලබන යම් කාරණයක් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම හා ඒ පිළිබඳ වාර්තා කිරීම.

(2) පරීක්ෂණ පැවැත්වීම හෝ වාර්තා කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් කාරණයක් මණ්ඩලයට යොමු කරන ලද අවස්ථාවක, ඒ පරීක්ෂණය හෝ වාර්තාව සම්බන්ධයෙන් වූ කිසිම සාකච්ඡාවකට මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගි නොවිය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක බලධරයා විය යුතු ය.

6. (1) පරීක්ෂණයක් කිරීම සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන යම් කාරණයක් පිළිබඳව පරීක්ෂණ හෝ විමර්ශන පැවැත්වීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් තම සාමාජිකයන්ගෙන් සමන්විත කමිටු, තත් කාර්යය සඳහා සාදනු ලබන රීතිවලට අනුකූලව පත් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ කමිටු.

(2) යම් පරීක්ෂණයක හෝ විමර්ශනයක කාර්යය සඳහා මණ්ඩලයේ එවැනි යම් කමිටුවකට, මණ්ඩලයේ සාමාජිකයකු නොවන තැනැත්තකු හෝ සාමාජිකයන් නොවන තැනැත්තන් මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ අනුමතියට යටත්ව ඇතුළත් කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

## පිරිවෙන් වර්ග කිරීම සහ පිරිවෙන් අභ්‍යාස ආයතන පිහිටුවීම

7. පිරිවෙන් අභ්‍යාස ආයතන හැර, සෙසු සියලු පිරිවෙන් පහත දැක්වෙන වර්ග තුනට ඇතුළත් වන සේ වර්ග කරනු ලැබේ:— පිරිවෙන් අභ්‍යාස ආයතන හැර, සෙසු පිරිවෙන් වර්ග කිරීම.

(අ) මූලික පිරිවෙන්;

(ආ) මහා පිරිවෙන්; සහ

(ඇ) පිරිවෙන් විද්‍යායතන.

මූලික පිරිවෙන්.

8. (1) මූලික පිරිවෙනක පිරිවෙන I වන ශ්‍රේණියේ සිට පිරිවෙන V වන ශ්‍රේණිය දක්වා පංති පැවැත්විය යුතු ය.

(2) මූලික පිරිවෙනක්, ඒ පිරිවෙනේ වාසික භික්ෂූන් වහන්සේලාට පංති පැවැත්වෙන, නේවාසික අධ්‍යාපනික ආයතනයක් විය යුතු ය:

එසේ වුවද, මූලික පිරිවෙනක පැවැත්වෙන පංතිවලට සහභාගි විමට ගිහි පිරිමි ශිෂ්‍යයන්ට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(3) සම්ප්‍රදායික පිරිවෙන් විෂය මාලාව ඉගැන්වීමට හා විනය රීති අනුව භික්ෂූන් වහන්සේලා පුහුණු කරවීමට මූලික පිරිවෙනක විෂය මාලාවේ ප්‍රධාන ස්ථානයක් දිය යුතු ය.

(4) යම් මූලික පිරිවෙනක අධ්‍යයන පාඨමාලාව අවසානයේ දී, මණ්ඩලයේ උපදෙස් අනුව විභාග කොමසාරිස්වරයා විසින් ඒ මූලික පිරිවෙනේ ශිෂ්‍යයන් සඳහා විභාගයක් පවත්වනු ලැබිය හැකි ය.

මහා පිරිවෙන්.

9. (1) මහා පිරිවෙනක ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමිතිය විසින් පවත්වනු ලබන විභාග සහ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඒ හා සමාන විෂය මාලාවක් සහිත වෙනත් විභාග සඳහා පංති පැවැත්විය යුතු ය.

(2) මූලික පිරිවෙනක අධ්‍යයන පාඨමාලාව අවසානයේ දී පැවැත්වෙන විභාගය හෝ මණ්ඩලය විසින් පිළිගන්නා ලද ඊට සමාන තත්වයක වෙනත් යම් විභාගයක් හෝ සමත් භික්ෂූන් වහන්සේ නමක් මහා පිරිවෙනකට ඇතුළත් කර ගනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත දක්වෙන විධිවිධානවල සඳහන් කර ඇති විභාග සමත් වී ඇති ගිහි පිරිමි ශිෂ්‍යයන් මහා පිරිවෙනකට ඇතුළත් කර ගත හැකි ය.

පිරිවෙන් විද්‍යායතන.

10. (1) පිරිවෙන් විද්‍යායතනයක ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමිතිය විසින් හෝ විභාග දෙපාර්තමේන්තුව විසින් හෝ මණ්ඩලය විසින් පිළිගන්නා ලද යම් විශ්ව විද්‍යාලයක් විසින් හෝ පවත්වනු ලබන විභාග සඳහා පංති පැවැත්විය යුතු ය.

(2) මූලික පිරිවෙනක අධ්‍යයන පාඨමාලාව අවසානයේ දී පැවැත්වෙන විභාගය සමත් භික්ෂූන් වහන්සේලා සහ ආණ්ඩුවේ පාඨශාලාවක VIII වන ශ්‍රේණියේ විභාගය සමත් ගිහි පිරිමි ශිෂ්‍යයන් පිරිවෙන් විද්‍යායතනයකට ඇතුළත් කරනු ලැබිය හැකි ය.

විෂය මාලාව සහ අධ්‍යයන පාඨමාලාවේ කාලසීමාව.

11. යම් පිරිවෙනක විෂය මාලාව සහ අධ්‍යයන පාඨමාලාවේ කාල සීමාව, 8(3) වන වගන්තියට යටත්ව, මණ්ඩලය විසින් නියම කළ යුතු ය.

පිරිවෙන් පිහිටිය යුතු ස්ථාන සහ ඒවායේ කාන්තාධිකාරය.

12. (1) මූලික පිරිවෙනක් සහ මහා පිරිවෙනක් එකම ස්ථානයක, එකම කාන්තාධිකාරය යටතේ පවත්වනු ලැබිය හැකි ය.

(2) මූලික පිරිවෙනක් හෝ මහා පිරිවෙනක් පිහිටි ස්ථානයක් තුළ හෝ එවැනි පිරිවෙනක් යටත් වන කාන්තාධිකාරයට යටත්ව පිරිවෙන් විද්‍යායතනයක් නොපැවැත්විය යුතු ය.

පිරිවෙන් අභ්‍යාස ආයතන.

13. පහත සඳහන් අරමුණු මුදුන්පත් කර ගැනීමේ කාර්ය සඳහා භික්ෂූන් වහන්සේලා පුහුණු කරවීම පිණිස පිරිවෙන් අභ්‍යාස ආයතන යනුවෙන් හඳුන්වනු ලබන අධ්‍යාපනික ආයතන මණ්ඩලය විසින් පිහිටුවිය යුතු ය:—

(අ) පිරිවෙන්වල ඉගැන්වීම;

(ආ) බුද්ධ ධර්මය සහ බෞද්ධ සංස්කෘතිය පතුරුවා හැරීම හා බෞද්ධ ජීවන ක්‍රමය ප්‍රචලිත කිරීම;

(ඇ) සමාජ සේවය;

(ඈ) බෞද්ධ භාවනා ක්‍රමවල යෙදීම;

(ඉ) බුද්ධ ධර්මය හා විනය පිළිබඳ දැනුමක් ලබාගැනීම; සහ

(ඊ) බුද්ධ ධර්මය ඉගැන්වීම

14. යම් නිශ්චිත පිරිවෙන් අභ්‍යාස ආයතනයක අධ්‍යයන පාඨමාලා පැවැත වීමේ කාර්යය සඳහා 13 වන වගන්තියෙහි සඳහන් අරමුණු අතුරින් කවර අරමුණක් තෝරා ගත යුතු ද යන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලය විමසා, කලින් කල නිශ්චය කළ යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධ්‍යයන පාඨමාලා නිශ්චය කළ යුතු බව.

15. සෑම පිරිවෙන් අභ්‍යාස ආයතනයකට ම සාමාජිකයන් තුන් දෙනකුගෙන් සමන්විත උපදේශක කමිටුවක් තිබිය යුතු අතර, ඒ ආයතනයේ කෘත්‍යාධිකාරින් වහන්සේ ඒ කමිටුවේ එක් සාමාජිකයකු විය යුතු ය. සෙසු සාමාජිකයන් දෙදෙනා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කළ යුතු ය.

පිරිවෙන් අභ්‍යාස ආයතනවල උපදේශක කමිටු.

16. 15 වන වගන්තියෙහි සඳහන් කර ඇති උපදේශක කමිටුවේ සාමාජිකයන්ට යම් පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකම් නොලැබෙන්නේ ය:

සාමාජිකයන්ට පාරිශ්‍රමික නොලැබිය යුතු බව.

එසේ වුව ද, ඒ සාමාජිකයන්ට දීමනාවක් ගෙවීම යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, ඔහු විසින් ඒ සාමාජිකයන්ට එසේ දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

17. පිරිවෙන් අභ්‍යාස ආයතනයක් නිසි ලෙස කෘත්‍යාධිකාරය කිරීමෙහි ලා, මේ පනතේ විධිවිධානවලට යටත්ව, ආයතනාධිපතීන් වහන්සේට සහායවීම ඒ පිරිවෙන් අභ්‍යාස ආයතනයේ උපදේශක කමිටුවේ කාර්ය විය යුතු ය.

උපදේශක කමිටුවක බලතල සහ කාර්ය.

## IV වන කොටස

### අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය

18. (1) අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, මේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

(2) මේ පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධරයන් පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ නියමයන්ට හෝ මේ පනත යටතේ සාදනු ලබන යම් නියෝගවල නියමයන්ට අනුකූල වන යම් පිරිවෙනක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ කල්හි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලය විමසා, ඒ පිරිවෙන ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ලෙස සලකනු ලබන යම් පිරිවෙනකට මේ පනතට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවලට අනුකූලව, රජයේ මුදල්වලින් ආධාර මුදලක් ලැබීමට හිමිකම තිබිය යුතු ය.

## V වන කොටස

### පිරිවෙන් කෘත්‍යාධිකාරීන් වහන්සේලා, පරිවේණාධිපතින් වහන්සේලා සහ පරිවේණාචාර්යවරු

පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ.

19. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලැබූ කෘත්‍යාධිකාරීන් වහන්සේ නමක් සෑම පිරිවෙනකට ම සිටිය යුතු ය.

මූලික පිරිවෙන්වල, මහා පිරිවෙන්වල සහ පිරිවෙන් විද්‍යායතනවල කෘත්‍යාධිකාරීන් වහන්සේලා.

20. (1) යම් පිරිවෙනක්, මූලික පිරිවෙනක් හෝ මහා පිරිවෙනක් හෝ පිරිවෙන් විද්‍යායතනයක් හෝ වන අවස්ථාවක, ඒ පිරිවෙන පිහිටුවා තිබෙන්නේ යම් ඉඩමක ද ඒ ඉඩම අයත් විහාරස්ථානයේ විහාරාධිපතීන් වහන්සේ කැමති වුවහොත්, උන්වහන්සේ ඒ පිරිවෙනේ කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබීමට විහාරාධිපතීන් වහන්සේ කැමති නොවූ අවස්ථාවක, ඒ විහාරාධිපතීන් වහන්සේ විසින් කෘත්‍යාධිකාරි තනතුරට වෙනත් භික්ෂූන් වහන්සේ නමක් නිර්දේශ කරනු ලැබුවහොත්, ඒ භික්ෂූන් වහන්සේ එසේ පත් කිරීම සඳහා සුදුසු බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්විණි නම් ඒ භික්ෂූන් වහන්සේ ඒ පිරිවෙනේ කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(3) විහාරාධිපතීන් වහන්සේ නමක් විසින් නිර්දේශ කරනු ලැබූ භික්ෂූන් වහන්සේ කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් පත් කරනු ලැබීමට සුදුසු බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් නොවූ අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සුදුසු භික්ෂූන් වහන්සේ නමක් ඒ පිරිවෙනේ කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(4) කිසිම භික්ෂූන් වහන්සේ නමක් එක පිරිවෙනකට වැඩි පිරිවෙන් ගණනක කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය:

එසේ වුවද, යම් මූලික පිරිවෙනක් සහ මහා පිරිවෙනක් එකම ස්ථානයක පිහිටා ඇති අවස්ථාවක, ඒ පිරිවෙන් දෙකෙහිම

කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් එකම භික්ෂූන් වහන්සේ නමක් පත් කරනු ලැබිය හැකි ය.

(5) යම් භික්ෂූන් වහන්සේ නමක් එක විහාරස්ථානයකට වැඩි විහාරස්ථාන ගණනක විහාරාධිපති වන සහ ( (4) වන උපවගන්තියේ අතුරු විධානයෙහි දක්වා ඇති අවස්ථාව හැර) ඒ විහාරස්ථානවලට අයිති ඉඩම්වල පිරිවෙන් දෙකක් හෝ වැඩි ගණනක් පිහිටා ඇති අවස්ථාවක, ඉන් එක් පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් තමා පත් කරනු ලැබීමට ඒ විහාරාධිපතීන් වහන්සේ විසින්ම තම කැමැත්ත ප්‍රකාශ කරනු ලැබිය හැකි අතර, එකී සෙසු පිරිවෙන්වලින් කවර වූ හෝ පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් පත් කිරීම සඳහා විහාරාධිපතීන් වහන්සේ විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, වෙනත් භික්ෂූන් වහන්සේ නමක් නම් කරනු ලැබිය හැකි ය.

(6) විහාරස්ථානයක විහාරාධිපතීන් වහන්සේ බාලවයස්කාරයකු හෝ යම් මානසික හෝ ශාරීරික අශක්තතාවයකින් පෙළෙන්නකු වන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ විහාරස්ථානයේ දායක සභාව සහ මණ්ඩලය විමසීමෙන් පසු, ඒ විහාරාධිපතීන් වහන්සේ වයස් පූර්ණත්වයට පත් වන තුරු හෝ අශක්තතාවෙන් මිදෙන තුරු, ඒ විහාරස්ථානයට අයත් යම් ඉඩමක පිහිටි යම් පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් කටයුතු කිරීම සඳහා සුදුසු භික්ෂූන් වහන්සේ නමක් පත් කළ යුතු ය.

(7) විහාරස්ථානයක විහාරාධිපති ධුරය සම්බන්ධයෙන් යම් ආරාවුලක් පවතින අවස්ථාවක, ඒ ආරාවුල සමථයකට පත් කරනු ලබන තුරු, මණ්ඩලය විමසීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ විහාරස්ථානයට අයත් යම් ඉඩමක පිහිටි යම් පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් තාවකාලික පත්කිරීමක් කළ යුතු ය.

පිරිවෙන් අභ්‍යාස ආයතනයක කෘත්‍යාධිකාරීන් වහන්සේ.

21. පිරිවෙන් අභ්‍යාස ආයතනයක කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් පත් කරනු ලැබීම සඳහා සුදුසු භික්ෂූන් වහන්සේ නමක් මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට නිර්දේශ කරනු ලැබිය යුතු ය.

ජනරජය යටතේ වැටුප් ලබන තනතුරක් දරන්නකු කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් පත් කරනු ලැබීමට සුදුසු නොවන බව.

22. (1) ජනරජය යටතේ යම් වැටුප් ලබන තනතුරක් දරන භික්ෂූන් වහන්සේ නමක්, පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය.

(2) විහාරස්ථානයක විහාරාධිපතීන් වහන්සේ නමක් ජනරජය යටතේ වැටුප් ලබන තනතුරක් දරන්නකු වන අවස්ථාවක, 20 වන වගන්තියේ කාර්ය සඳහා, උන්වහන්සේ පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ කෙනකු වශයෙන් පත් කරනු ලැබීමට තම කැමැත්ත ප්‍රකාශ කර නොමැති සේ සලකනු ලැබිය යුතු අතර, ඒ වගන්තියේ සඳහන් පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ කෙනකු පත් කිරීම සම්බන්ධයෙන් ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති එපරිද්දෙන්ම අදාළ විය යුතු ය.

පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට වගකිව යුතු බව.

23. පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ ඒ පිරිවෙන නිසි ලෙස පරිපාලනය කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට වගකිව යුතු ය.

පිරිවෙන්වල කෘත්‍යාධිකාරීන් වහන්සේලාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**24.** මේ පනතේ සහ ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන වලට යටත්ව, පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන ඒවා වන්නේ ය :—

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිරිවෙන සඳහා නියම කරනු ලබන සුදුසු හා ප්‍රමාණවත් ඉඩ පහසුකම්, ගෘහභාණ්ඩ, උපකරණ, සනීපාරක්ෂක සහ වෙනත් පහසුකම් සැලසීම ;

(ආ) නියම කරනු ලබන අධ්‍යාපනික හා සංස්කෘතික තත්ත්වයන් පිරිවෙනෙහි පවත්වාගෙන යෑම ;

(ඇ) මණ්ඩලයේ අනුමතයට යටත්ව, පිරිවෙනෙහි පරිවේණාධිපතීන් වහන්සේ හා ආචාර්යවරයන් පත් කිරීම සහ ඔවුන්ගේ සේවය නතර කිරීම ;

(ඈ) පිරිවෙන වෙනුවෙන් රජයේ අරමුදලින් ගෙවනු ලබන ආධාර මුදල් පිරිවෙනේ උපරිම යහපත සඳහා යෙදවීම ;

(ඉ) පිරිවෙනේ සාමාන්‍ය පරිපාලනය හා නිසි නඩත්තු කිරීම සම්බන්ධයෙන් වගකීම ;

(ඊ) පිරිවෙනේ ආචාර්ය මණ්ඩලය වෙත පවරනු ලැබ ඇති කර්තව්‍ය හා කාර්ය ඒ ආචාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන බවට සහ කලින් කල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුකූලව ඒ ආචාර්ය මණ්ඩලය ක්‍රියා කරන බවට වග බලා ගැනීම ; සහ

(උ) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් කරුණක් නිසා හෝ තම කාර්ය ඉටු කිරීමට කෘත්‍යාධිකාරීන් වහන්සේට නොහැකි වන අවස්ථාවක, කෘත්‍යාධිකාරි වශයෙන් කටයුතු කිරීම සඳහා සුදුසු යයි මණ්ඩලයට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිළිගත හැකි තැනැත්තකු නිර්දේශ කිරීම.

පිරිවෙන්වල පරිවේණාධිපතීන් වහන්සේලා.

**25.** යම් තැනැත්තකුට පහත දැක්වෙන සුදුසුකම් නොතිබේ නම්, පිරිවෙනක පරිවේණාධිපතීන් වහන්සේ ලෙස පත් කරනු ලැබීමට ඔහු නුසුදුසු වන්නේ ය :—

(අ) පත්වීමේ දිනයට අවුරුදු පහකට නොඅඩු කාලයකට පෙර ඔහු උපසම්පදාව ලැබූ භික්ෂූන් වහන්සේ නමක් වීම ; සහ

(ආ) ඔහු—

(i) ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ පණ්ඩිත විභාගය සමත්වී සිටීම ; හෝ

(ii) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා සිටීම ; හෝ

(iii) අනුරාධපුර බුද්ධ ශ්‍රාවක ධර්මපීඨයේ උපාධිය ලබා සිටීම ; හෝ

(iv) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද පිරිවෙන් අභ්‍යාස ආයතනයකින් ප්‍රථම පන්තියේ පුහුණු ගුරු සහතිකයක් ලබා සිටීම; හෝ

(v) විද්‍යෝදය, විද්‍යාලංකාර මහ පිරිවෙන්වල අවසාන පරීක්ෂණ සහතිකය ලබා තිබීම:

එසේ වුවද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පිරිවෙනක පරිවේණාධිපතිවරයකු වූ භික්ෂූන් වහන්සේ නමක් විසින් (ආ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද, ඒ පිරිවෙනේ පරිවේණාධිපති වශයෙන් දිගටම කටයුතු කරනු ලැබිය හැකි ය.

26. (1) යම් තැනැත්තකු භික්ෂූන් වහන්සේ නමක් වේ නම් මිස, ඔහු පරිවේණාචාර්යවරයකු වශයෙන් පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය: පිරිවෙන්වල පරිවේණාචාර්යවරු.

එසේ වුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සඳහන් කරනු ලබන යම් විෂයයන් සඳහා ආචාර්යවරයකු වශයෙන් පත් කිරීමට සුදුසු භික්ෂූන් වහන්සේ නමක් සොයා ගත නො හැකි අවස්ථාවක, සුදුසුකම් ලත් ගිහියකු පරිවේණාචාර්යවරයකු වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) පරිවේණාචාර්යවරයන් සඳහා අවම අධ්‍යාපනික සුදුසුකම් නියම කරනු ලබන සුදුසුකම් විය යුතු අතර විවිධ විෂයයන් සම්බන්ධයෙන් විවිධ සුදුසුකම් නියම කරනු ලැබිය හැකි ය.

(3) ආචාර්යවරයකු ලෙස පිරිවෙනකට පත් කරනු ලැබූ භික්ෂූන් වහන්සේ නමකට මාසික රැකුමක් ගෙවනු ලැබිය යුතුය. එම රැකුම ඒ භික්ෂූන් වහන්සේ විසින් නම් කරනු ලබන කැපකරුවකුට ගෙවනු ලැබිය යුතුය:

එසේ වුවද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ පූර්ණ කාලීන පරිවේණාචාර්යවරයකු වූ භික්ෂූන් වහන්සේ නමක් විසින් උන් වහන්සේගේ වැටුප දිගටම ලබාගත හැකි ය.

(4) පරිවේණාචාර්යවරයකු වශයෙන් පත් කරනු ලැබූ ගිහියකුට ඇති සුදුසුකම් අනුව, නියම කරනු ලබන වැටුපක් ඔහුට ගෙවිය යුතු අතර ඒ වැටුප ඔහුට කෙළින්ම ගෙවනු ලැබිය හැකි ය.

(5) මේ පනතේ කාර්ය සඳහා මණ්ඩලය විසින් පරිවේණාචාර්ය නාම ලේඛනයක් පවත්වා ගෙන යා යුතු අතර සියලු ලියාපදිංචි පිරිවෙන්වල ආචාර්යවරයන්ගේ හා පරිවේණාධිපතීන් වහන්සේලාගේ නම් එහි ඇතුළත් විය යුතු ය.

ඇතැම් කාරණා නියම කළ යුතු බව.

27. (1) ආචාර්යවරයන් හා පරිවේණාධිපතීන් වහන්සේලා පත් කිරීම, අස් කිරීම හා ඔවුන් පිළිබඳ විනය පාලනය හා සම්බන්ධ කාර්ය පටිපාටිය ඇතුළුව ඔවුන්ගේ සේවා කොන්දේසිවලට සම්බන්ධ සියලු කාරණා සහ වැටුප් ගෙවීම නියමිත පරිදි විය යුතු ය.

(2) පරිවේණාචාර්යවරයකු වශයෙන් හෝ අන් ලෙසකින් හෝ පිරිවෙනක කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබීමට පිරිමි පමණක් සුදුස්සන් විය යුතු ය.

## VI වන කොටස

### පොදු විධිවිධාන

පවතින පිරිවෙන් මේ පනත යටතේ තවදුරටත් පවත්වා ගෙන යා යුතු බව.

28. 1959 අගෝස්තු මස 7 වන දින අංක 11,828 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, කලින් කල සංශෝධිත, පිරිවෙන් නියෝග සංග්‍රහයේ 3 (6) වන නියෝගය යටතේ, ලියාපදිංචිය ස්ථිර කරනු ලැබුවාවූ ද, නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ පවත්වා ගෙන යමින් තිබුණාවූ ද සෑම පිරිවෙනක්ම මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ පිරිවෙනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පවතින යම් පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ, පරිවේණාධිපතීන් වහන්සේ සහ පරිවේණාචාර්යවරයන්.

29. මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ පිරිවෙනක් ලෙස 28 වන වගන්තිය යටතේ සලකනු ලබන පිරිවෙනක කෘත්‍යාධිකාරීන් වහන්සේ නමක් හෝ පරිවේණාධිපතීන් වහන්සේ නමක් හෝ පරිවේණාචාර්යවරයකු වූ ද, නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ ඒ තත්ත්වයෙන් කටයුතු කරමින් සිටියා වූ ද ඒ සෑම තැනැත්තකුම, පිළිවෙළින් මේ පනත යටතේ පත් කරනු ලැබූ කෘත්‍යාධිකාරීන් වහන්සේ හෝ පරිවේණාධිපතීන් වහන්සේ හෝ පරිවේණාචාර්යවරයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනතට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකට හෝ යටත්ව, ඒ සෑම තැනැත්තකුම විසින් මේ පනත යටතේ ඒ තත්ත්වයෙන් තවදුරටත් කටයුතු කළ යුතු ය.

මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි බව.

30. අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මණ්ඩලය විසින් 4 (16) වන සහ 6 වන වගන්තිවල සඳහන් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි අතර, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සෑම රීතියක්ම, තත් කාර්යය සඳහා කැඳවනු ලැබූ මණ්ඩලයේ රැස්වීමක දී ඒ රීති අනුමත කරනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

ලියාපදිංචි කරනු ලැබූ පිරිවෙන් මේ පනතට අනුකූල විය යුතු බව.

31. මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන සෑම පිරිවෙනක් ම මේ පනතේ සහ ඒ යටතේ සාදනු ලබන නියෝගවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

පිරිවෙනකට ගෙවනු ලබන ආධාර මුදල්.

32. මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන යම් පිරිවෙනක් නඩත්තු කිරීම, ආචාර්යවරුන්ගේ වැටුප් සහ පුස්තකාල ආධාර සම්බන්ධයෙන් රජයේ අරමුදල්වලින් ඒ පිරිවෙනට ගෙවනු ලබන ආධාර මුදල්, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, නියම කරනු ලබන ප්‍රමාණ අනුව විය යුතු ය.

නියෝග.

33. (1) මේ පනත යටතේ නියෝග සෑදීමට බලය දෙනු ලැබ ඇති හෝ නියම කරනු ලැබ ඇති කරුණු සියල්ලම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) පිරිවෙන් ලියාපදිංචි කිරීම, වර්ග කිරීම, ශ්‍රේණිගත කිරීම, ඒ ලියාපදිංචිය අවලංගු කිරීම, රජයේ අරමුදල්වලින් ආධාර මුදල් ගෙවීම සහ ඒ ආධාර මුදල් ගෙවිය යුත්තේ යම් නියමවලට හා කොන්දේසිවලට යටත්ව ද ඒ නියම හා කොන්දේසි ;

(ආ) ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකාවෙහි පිරිවෙන් උපරිම සංඛ්‍යාව සහ පිරිවෙනකට ඇතුළත් කර ගනු ලැබීමට සුදුසුකම් ඇති උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව නිශ්චය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු;

(ඇ) පරිවේණාචාර්යවරයන්ගේ නාමලේඛනයක් පවත්වා ගෙන යාම, පිරිවෙන්වල කෘත්‍යාධිකාරීන් වහන්සේලා පත් කිරීම හා කෘත්‍යාධිකාරීන් වහන්සේලාගේ සේවය නතර කිරීම සහ කෘත්‍යාධිකාරීන් වහන්සේලාගේ කර්තව්‍ය හා කාර්ය ;

(ඈ) පරිවේණාධිපතීන් වහන්සේලා ඇතුළු පරිවේණාචාර්යවරුන් පත් කිරීම, මාරු කිරීම, ඔවුන්ගේ සේවය නතර කිරීම, ඔවුන්ගේ සුදුසුකම් හා ඔවුන් ශ්‍රේණිගත කිරීම සහ වැටුප් ක්‍රම නිශ්චය කිරීම;

(ඉ) පිරිවෙනක කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට වැටුප් ගෙවීමේ කාර්ය පටිපාටිය ;

(ඊ) පිරිවෙන්වල ශිෂ්‍යයන් ඇතුළත් කිරීම, ඔවුන්ගේ වයස් සීමා හා පිරිවෙන්වල භික්ෂූන් වහන්සේලා සහ ගිහි ශිෂ්‍යයන් අතර නියමිත අනුපාතයන් පවත්වා ගෙන යාම සහ පිරිවෙන්වල අධ්‍යයන පාඨමාලා හා විෂයමාලා හා එහි ලා භාවිත කළ යුතු පොත්, ආම්පන්න සහ උපකරණ ;

(උ) පිරිවෙන් අභ්‍යාස ආයතනවල භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, අධ්‍යයන පාඨමාලා සහ ඒවායේ කාල සීමා ;

(ඌ) පිරිවෙන් විභාග සහ පරීක්ෂණය කිරීම්, පිරිවෙන්වලින් ප්‍රදානය කළ යුතු සහතික හා අභිඥාන පත්‍ර ; සහ

(එ) පිරිවෙන්වල විනය පවත්වා ගෙන යාම.

(3) මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එයේ පළ කරනු ලබන දිනයෙහි සිට හෝ ඒ නියෝගයේ සඳහන් කරනු ලබන පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම එය පළ කරනු ලබන දිනයෙන් පසු හැකි තාක් ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ අනනුමතයේ දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් යම් දිනයක සිට අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන විටක, ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

පරිච්ඡින්න කිරීම.

34. 1959 අගෝස්තු මස 7 වන දින අංක 11,828 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ කලින් කල සංශෝධිත, පිරිවෙන් නියෝග සංග්‍රහය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ:

එසේ වුව ද, නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ බලපවතිමින් තිබුණා වූ ද මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද යම් නියෝගයක්, එකී පරිච්ඡින්න කිරීම නොතකා, මේ පනතේ විධිවිධාන යටතේ සාදනු ලැබූ නියෝගයක් ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද, ඒ නියෝගය එලෙස බලාත්මක විය යුතු අතර, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මඟින් ඕනෑම විටෙක එය සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

35. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

"භික්ෂූන් වහන්සේ" යන්නට සාමණේරයන් වහන්සේ නමක් ද ඇතුළත් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් ධුරය තත් කාලයේ දරන තැනැත්තා අදහස් වන අතර 4 වන වගන්තියේ කාර්ය සඳහා හැර, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු හෝ මේ පනතේ කාර්ය සඳහා තමා වෙනුවෙන් කටයුතු කිරීම පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් නිලධරයකු ද ඊට ඇතුළත් වේ;

"පිරිවෙන" යන්නෙන්—

(අ) 32 වන වගන්තිය යටතේ රජයේ අරමුදල්වලින් ආධාර මුදලක් ලබන්නා වූ ද, භික්ෂූන් වහන්සේ නමකගේ කෘත්‍යාධිකාරීත්වය යටතේ පවතින්නා වූ ද, තම අරමුණු හා පරමාර්ථ වශයෙන් 2 වන සහ 3 වන වගන්තිවල සඳහන් අරමුණු හා පරමාර්ථ පිළිගෙන ඇත්තා වූ ද අධ්‍යාපනික ආයතනයක්, හෝ

(ආ) 13 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පිරිවෙන් අභ්‍යාස ආයතනයක්

අදහස් වේ;

"පිරිවෙන් අධ්‍යාපනය" යන්නෙන් පිරිවෙනක දෙනු ලබන අධ්‍යාපනය අදහස් වේ; තව ද

"විහාරස්ථානය හා විහාරාධිපතීන් වහන්සේ" යන්නෙන් බෞද්ධ විහාර හා දේවාලගම් ආඥාපනතෙහි ඒවාට දී ඇති අර්ථ ම ඇත්තේ ය.